ශීර්ෂය 194 - තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 194 - තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජූනි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය **කරනු නොලැබේ.**

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඩයලොග් ආයතනය එක්ව සමාලෝචිත වර්ෂය තුල සංවිධානය කර පවත්වා තිබූ **Sri Lanka Sports Fiesta** 2024 වැඩසටහන සඳහා රු.මිලියන 40 ක මුදල් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ජාතික ක්‍රීඩා අරමුදලෙන් හා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලබා දී තිබුණද, එම මුදල ආදායම් නොවන ලැබීම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. තවද, මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දින 03 තුල පවත්වාගෙන ගිය අලෙවිසැල් වෙතින් ලද ආදායම හා අනුග්‍රාහක ලැබීම්ද ගිණුම් වලට නොගෙන අත්හැරී තිබුණි.	වැඩසටහන සඳහා වන සියලු කටයුතු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඇති අතර ක්‍රීඩා අරමුදල මඟින් රු.මි.40 ක් ලබා දීම පමණක් සිදු කර ඇත. මෙම වැඩසටහන් මඟින් උපයා ගන්නා ලද ආදායම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වෙත වාර්තා වී නොමැත.	රජයට ලැබිය යුතුව තිබූ ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබීම පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර එම ආදායම් ඇතුළු ලැබුණු ආදායම්ද ගිණුම් වලට ගැනීමට කටයුතු කල යුතුය.

(ආ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වෙන් කර තිබූ ප්‍රතිපාදන උපයෝජනය කරමින් වෙනත් ආයතන මගින් දැරූ රු.මිලියන 2,427.69 ක පුනරාවර්තන වියදම් මු.රෙ. 208 යටතේ මූල්‍ය ප්‍රකාශන වල වෙනම පෙන්විය යුතු වුවද, එම වියදම් අමාත්‍යාංශය දැරූ වියදමක් ලෙස සලකා ඒ.සී.ඒ. 2 **(ii)** ආකෘතියේ දක්වා තිබුණි.	එකඟ වේ. සටහන් කිරීමේ දෝෂයක් නිසා ශුද්ධ ප්‍රතිපාදනයට අදාල වටිනාකම මූලික ප්‍රතිපාදනය යටතේ සටහන් කර ඇති අතර එම වෙනස මු.රෙ. 66/69 මාරු කිරීම් වලට ඇතුලත් විය යුතුය.	නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.19,580 ක ණය ශේෂයක් ද, විශ්‍රාම ගිය නිළධාරියෙකුගේ වර්ෂ 1 කට අඩු කාලයක් තුල පැවති අයවිය යුතු ණය ශේෂය රු.137,740 ක් ද අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන දිනවන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.	රු. 19,580 ක ණය ශේෂය කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන වෙත පවරා දීමට හා අනෙක් ණය ශේෂය ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය.

(ඈ) තැන්පතු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේ දී ඒ.සී.ඒ. 04 ආකෘතිය යටතේ වූ එක් එක් පොදු තැන්පතුවට අදාල 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය සටහන් කිරීමේ දී වැරදි අගයන් අතුලත් කර තිබීම හේතුවෙන් එම අගයන් හා භාණ්ඩාගාර ආකෘතිපත්‍ර **SA** – 30 හි සඳහන් ආරම්භක ශේෂයන් අතර රු.41,516,933 ක වෙනසක් පැවතුණු බව නිරීක්ෂණය විය.	එකඟවේ. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වලක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.	නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය.

(ඉ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ රු.358,000,000 ක් වටිනා ගොඩනැගිල්ලක් සහිත ඉඩම, ක්‍රීඩා විද්‍යා ආයතනය හා ක්‍රීඩා වෛද්‍ය ආයතනය ස්ථාපිත කර ඇති ඉඩම්, ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධව පවතින ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් 03 ක් හා ගොඩනැගිලිවල වටිනාකම, සහ ජාතික	ඉඩම පැවරීම හා අදාල තක්සේරු කිරීම අවසන් කලපසු ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ.	අදාළ ඉඩම්වල වටිනාකම තක්සේරු කර කඩිනමින් ගිණුම් වලට ගැනීමට කටයුතු කල යුතුය.

	ක්‍රීඩා සභාවට අයත් ඉඩම, ගොඩනැගිල්ල හා යන්ත්‍රෝපකරණ සහ දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය යනාදිය තක්සේරු කොට නිවැරදි අගයන් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.		
(ii)	නායකත්ව සංවර්ධන මධ්‍යස්ථාන භූමියේ පවතින දැවමය වටිනාකමක් සහිත වෘක්ෂ හා තැඹිලි, පොල්, අඹ යනාදි කෘෂිකාර්මික වටිනාකමකින් යුත් ශාකවල වටිනාකම හඳුනාගෙන එම වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාකර ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි.	ජීව විද්‍යාත්මක වටිනාකම් සහිත වත්කම් වල වටිනාකම තක්සේරු කර කඩිනමින් ගිණුම් වලට ගැනීමට කටයුතු කල යුතුය.
(iii)	විගණන නියදි පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේදි අමාත්‍යාංශය විසින් කුඩා ව්‍යාපාර අංශයේ ප්‍රාදේශීය කාර්යාල වෙත නිදහස් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කරමින් රු.10,787,734 ක ජංගම නොවන වත්කම් මිලදී ගෙන තිබුණද එම වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි.	මිලදී ගත් මූලධන වත්කම් කඩිනමින් ගිණුම් වලට ගැනීමට කටයුතු කල යුතුය.
(iv)	කෙරීගෙනයන වැඩ ශේෂය තුළ දීර්ඝකාලීනව පවතින රු.1,067,615,012 ක් වටිනා ව්‍යාපෘති 27 කින් දැනටමත් නිම කළ ව්‍යාපෘති හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත් ඉහත ව්‍යාපෘතිවලින් වෙනත් රජයේ ආයතන හා පාසල්වලට පවරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදුකිරිමටත් මේ දක්වා අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.	දැනට පවතින ශේෂයෙහි නිම කල ව්‍යාපෘති හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු සිදු කරමින් පවති.	නිම කළ ව්‍යාපෘති හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා වෙනත් රජයේ ආයතන හා පාසල්වලට පවරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ගැලපීම් අමාත්‍යාංශය විසින් සිදුකල යුතුය.

(ඊ) අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ, විදුලි ජනන යන්ත්‍ර කාමර ව්‍යාපෘතිය, මුළුතැන්ගෙය හා ආපනශාලා ගොඩනැගිල්ලේ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සහ කටුගස්තොට ශාන්ත අන්තෝනි විද්‍යාලීය ක්‍රීඩා පිටිය සකස් කිරීම	අමාත්‍යාංශ ලේකම් විසින් 2025.06.06 දිනැතිව කමිටුවක් පත් කර ඇත. එම කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	හිඟ හිටි අත්තිකාරම් ශේෂ අය කර ගැනීමට කටයුතු කල යුතුය.

සඳහා 2019 වර්ෂයේ දී ලබා දී තිබූ එකතුව රු.මිලියන 26.79 ක අත්තිකාරම් ශේෂ 2024 වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 හි දක්වා ඇති විධිවිධාන අනුගමනය කරමින් නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු සකසාගෙන තිබීම හේතුවෙන් වැය විෂයන් 13 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ගෙන තිබූ රු.257,470,000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමනින්ම ඉතිරිකරගෙන තිබුණු අතර තවත් වැය විෂයයන් 05 කට අදාල ප්‍රතිපාදනයන් 50% ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයකින් වෙනත් වැය විෂයන්ට මාරුකර තිබීම හේතුවෙන් එම වැය විෂයන්ගේ ප්‍රතිපාදිත මුදල් 100% කින් හෝ ඊට වැඩි ප්‍රමානයක් වැඩි කරගෙන තිබුණි	ගෙවීම සඳහා වූ අවස්ථා ඇති නොවීම, අත්‍යවශ්‍යම වියදම් පමණක් සිදු කිරීම, ක්‍රීඩා වෛද්‍ය ආයතනය සඳහා වරිපනම් අංකයක් ලබා ගෙන නොමැති වීම, සහ සේවාව ලබා නොගැනීම මත මෙම ඉතිරිවීමට හේතු විය.	නිසි පුරෝකතනයකින් හා තාර්කික පදනමකින් ඇස්තමේන්තු පිළියෙල කර වියදම් දැරිය යුතුය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුලදී භාණ්ඩ හා සේවා ලබාගැනීම සඳහා පෞද්ගලික බැංකු 2 කින් රු.5,642,275 ක් වටිනා බැංකු ඇපකර 4ක් ලබාගෙන තිබුණු අතර ඒවායින් තුනක ඇපවීමේ කාලය 2025 අප්‍රේල් මස 03 වන දිනෙන් අවසන් වී තිබුණි.	ආදාල බැඳුම්කරය නිදහස් කරන ලෙස අප අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කල පසු ආදාල ඉ◌ැදුම්කරය නිදහස් කිරීමට කටයුතු කරන ලෙස අදාල කාර්යයසාධන බැඳුම්කරය	නියමිත දිනට ඇපකර වලින් නිදහස් වීමට කටයුතු කල යුතුය.

	එහෙත් 2024 දෙසැම්බර් 31 දිනට ඇපවීමේ කාලය නිමවූ රු.1,522,625 ක් වටිනා ඇපකරයෙන් නිදහස්වීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.	නිකුත් කල බැංකුවට දන්වා යවනු ලැබේ.	
(ආ)	බාහිර ආයතනය දෙකක් වෙත නිරවුල් කල යුතුව පැවති රු. 25,796,593 ක බැරකම් නිරවුල් කිරීම සඳහා වසර 03 ක කාලයක සිට කටයුතු කර නොතිබුණු අතර ඉන් රු.24,858,873 ක බැරකම් ගිණුම් ගත කර නොතිබුණි.	මානව කාර්යය සාදන විද්‍යාගාරයේ කටයුතු පවත්වා ගෙන යැම සඳහා කාර්යය මණ්ඩලයක් පත් කර වසරක කාලයක් සතුටුදායක අයුරින් විද්‍යාගාරය පවත්වා ගෙන යා යුතු නමුත් එය ඉටු කර නොමැති බැවින් මෙම මුදල රඳවා ගෙන ඇත.	අදාල බැරකම් නිරවුල් කිරීමට කටයුතු කල යුතු අතර ගිණුම් ගත නොකල බැරකම් ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පවතින ජාතික තරුණ සේවා සභාව වෙත මුදාහැරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අමාත්‍යාංශය වෙත ලද රු.මිලියන 493.52 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 74.20 ක් පමණක් සභාව වෙත ලබා දී තිබුණු අතර ඉතිරි මුදල වන රුපියල් මිලියන 419.32 සභාව විසින් දරන ලද වියදම් වෙනුවෙන් ප්‍රතිපූර්නය නොකර නැවත ජනාධිපති ලේකම් කාර්යාලය වෙත හරවා යවා තිබුණි.	ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබාදුන් ප්‍රතිපාදන සඳහා ජාතික තරුණ සේවා සභාව නියමිත ක්‍රමවේද අනුගමනය නොකිරීම නිසා එම ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට නොහැකිවිය.	නිසි අධීක්ෂණයකින් යුතුව ප්‍රතිපාදන අදාල ආයතන වෙත මුදාහැරීමට කටයුතු කල යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
	104 රෙගුලාසිය	193,044	ඇඹිලිපිටිය දිස්ත්‍රික් රෝහල විසින් 2020 වර්ෂයේදි නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස භාවිත කරන ලද කාලය තුල අස්ථානගත වූ වටිනාකම රු.193,044 ක් වූ භාණ්ඩ වර්ග 05 කට අයත් භාණ්ඩ අයිතම 240 ක්ද, වටිනාකම සොයාගත නොහැකි වූ භාණ්ඩ වර්ග 17 කට අයත් භාණ්ඩ අයිතම 199 ක්ද සම්බන්දයෙන් විගණිත දිනය වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි.	මු.රෙ. 104 (4) පූර්ණ වාර්තාව ඉදිරිපත්කිරීමට අදාළව පරීක්ෂණ මණ්ඩලයක් පත්කර මේවන විට පරීක්ෂණය සිදුකරමින් පවතී.	සිදුවූ පාඩුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	අංක 05/2020 දරන හා 2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කලමණාකරන චක්‍රලේඛනය				
	02 (ආ) ඡේදය		අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම ඵලදායී නොවන තත්වයේ පවතින වාහන 03ක් අපහරණය කිරීමට සඳහා අමාත්‍යාංශය වසර 02 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි.	අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම ඵලදායි නොවන තත්වයේ පවතින සියලුම වාහන අපහරණය කිරීම සඳහා කටයුතු කරමින් පවතී.	ඵලදායී නොවන තත්වයේ පවතින වාහන අපහරණය කිරීමට කටයුතු කල යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් අතරින් පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය කිරීම සහ දේශීය, විදේශීය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම යන කාර්යයන් ඉටු කරගැනීමට අමාත්‍යාංශය මේ දක්වා කටයුතු කර නොතිබුණි.	දේශිය විදේශිය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම යන කාර්යය 2023 වර්ෂයේ අගෝස්තු මස සිට මිනිස් බල හා රැකි රක්ෂා දෙපාර්තමේන්තුව යටතට පැවරී ඇත.	අමාත්‍යාංශයේ ප්‍රධන කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	2024 වාර්ෂික ඇස්තමේන්තුව අනුව, ලගාකර ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් ලඟා කරගැනීමේ ප්‍රගතිය වාර්ෂික කාර්සාධන වාර්තාවේ ඇතුලත් කර නොතිබුණු අතර ඒ පිලිබඳව තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොවීය.	මෙම කාර්ය සාධනයට ඇතුළත් විශේෂ දර්ශක සංශෝධනය කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.	ඇස්තමේන්තුව ප්‍රකාරව කාර්යසාධන දර්ශකය ඉදිරිපත් කල යුතුය.
(ඇ)	අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ රත්නපුර දිස්ත්‍රික්කයට අදාල කුඩා ව්‍යාපාර අංශයේ 2024 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම හා රත්නපුර දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර අංශය විසින් ඉදිරිපත් කළ 2024 ක්‍රියාකාරී සැලැස්ම අනුරූප නොවූ අතර ප්‍රධාන ක්‍රියාකාරකම් 73 ක වාර්ෂික ඉලක්කයන් ලගා කර ගැනීමේ ප්‍රගතිය 70% මට්ටමක පැවතුණි. ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇති වැඩසටහන් 24 ක් ක්‍රියාත්මක කර නොමැති අතර වර්ෂය තුළ සිදු කරන ලද ව්‍යාපාර ප්‍රවර්ධනය හා මාර්ගගත ව්‍යාපාර විශ්ලේෂණ වැඩ සටහන් 2 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වී නොතිබුණි. තවද, මොනරාගල දිස්ත්‍රික්කය තුල කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2024 වර්ෂයේදි අනුමත කල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.4,500,000 ක ප්‍රතිපාදන ලබා දි තිබුණද 2024 දෙසැම්බර් 31 දිනය වන විට රු.3,314,564 ක් පමණක් වැය කර තිබීමෙන් වෙන් කල ප්‍රතිපාදන මුදලින් රු.1,185,436 ක් ඌණ උපයෝජනය වී තිබුණි.	2024 වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර අංශයට අදාළ අනුමත ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ජනාධිපතිවරණය හා මහමැතිවරණ කාලය තුල වැඩසටහන් පැවැත්වීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අත්හිටවූ අතර අතිරේක කාලය තුල වැඩසටහන් පවත්වා අදාළ වාර්ෂික ඉලක්ක සපුරා ඇත.	ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කල යුතුය.

(ඇ)	ගම්පහ දිස්ත්‍රික්කය තුල තරුණ සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ සංවර්ධන සහයන් ලබාදීම සඳහා රු.9,800,000ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය ආරම්භයේදී වෙන්කරදී තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මකව නොතිබුණි. තව ද, ගම්පහ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කළ වැඩසටහන් 1,747 කින් වැඩසටහන් 883 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර එය අපේක්ෂිත වැඩසටහන් වලින් 50.54% ක් විය.	ප්‍රතිපාදන වෙන්කර දී තිබුණ ද මුදල ලබා දී නොමැත.	ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශය විසින් කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 28 දින රු.12,230,761 ක් වටිනාකමකට මාස 06 කින් නිම කිරීමට පෞද්ගලික ආයතනයකට පිරිනමා තිබුණු නමුත්, ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. තවද, අවස්ථා කිහිපයකදී කොන්ත්‍රාත් කාලසීමාව මාස 20 කින් දීර්ඝ කිරීම, අමතර වැඩ සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් විධිමත් අනුමැතියක් ලබා නොගෙන කටයුතු කිරීම, බේරුම්කරණ ක්‍රියාවලියකට කඩිනමින් යොමු නොවීම සහ මිල විචලනයන් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු විසින් එම තීරණ ලබා දිමට වසරකට වඩා වැඩි කාලයක් ගත කිරීම ආදී කරුණු හේතුවෙන්, එකඟ වූ වටිනාකමට වඩා රු.4,225,610 ක බදු සහිත වටිනාකමක් අමතරව ගෙවා තිබුණි. දුනු විදීම හා වෙඩි තැබීමේ ක්‍රීඩා සඳහා ක්‍රීඩා පිටිය භාවිතා කළ හැකි තත්ත්වයට මේ වෙන තෙක් පත් කිරීමට නොහැකිවීම යන කරුණු මත අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට, එහි කාර්ය මණ්ඩලයට නොහැකි වී තිබුණි.	මේ සම්බන්ධව කරුණු පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් 2025.06.06 දිනැතිව කමිටුවක් පත් කර ඇත. එම කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර කාර්යක්ෂමතාවයෙන් හා අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති සැලසුම් කල යුතුය. තවද ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කළමනාකරණය සහ නියාමනය සිදුකළ යුතුය.

(ආ)	අමාත්‍යාංශය විසින් දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර්ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීමට අදාලව 2017 සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 3,866 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන රු. මිලියන 606 ක් පමණක් වියදම් කර තිබුණි. තවද, රු. මිලියන 487 ක් වැය කර ඉදිකර තිබූ මීටර් 400 කෘත්‍රිම ධාවන පථයේ ස්ථාන කිහිපයක පළුදු වී පැවතීම හා මන්තීරු වෙන් කරන ලද ඉරි මැකී ගොස් තිබීම හේතුවෙන් එම ධාවන පථයේ තරඟ සඳහා සහභාගී වන ක්‍රීඩකයන් අපහසුතාවට පත්වී තිබුණු අතර ක්‍රීඩා සඳහා භාවිතා කල නොහැකි තත්වයේ පවතින පැරණි ධාවන පථය පිහිටි ප්‍රේක්ෂකාගාරයේ වහලය ගැලවී ගොස් තිබුණි. එමෙන්ම රු. මිලියන 34 ක් වැය කර ඇති කුඩා ප්‍රේක්ෂකාගාරයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් වුවද සම්පූර්ණයෙන් වැඩ නිම වීමට පෙර එම ගිවිසුම අවලංගු කර තිබූ අතර මෙහි විදුලිජනක යන්ත්‍ර සවි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 30 ක් වැය කර සියයට 65 ක ඉදිකිරීම් ප්‍රගතියක් පැවතියදී ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර තිබුණි.	2025.06.04 දින දින අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ සම්බන්ධ පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කර ඇත. එම කමිටු වාර්තාවට අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කළමනාකරණය හා නියාමනය කිරීමෙන් නිශ්චිත කාලය තුල වැඩ නිම කිරීමට කටයුතු කල යුතුය.
(ඇ)	මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපනය කිරීම සඳහා ටෙක්නොමෙඩික්ස් ඉන්ටර්නැෂනල් නැමැති පෞද්ගලික ආයතනය වෙත 2024 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 273.67 ක් ගෙවා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා විධිමත් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් ද සිදු කර නොතිබුණි. කාර්ය මණ්ඩලය ස්ථාපනය කිරීමට කටයුතු නොකිරීම මත 2025 අප්‍රේල් 22 දින වන විටත් පරීක්ෂණාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගත නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි.	කාර්යය මණ්ඩලය ස්ථාපනය කිරීමට කටයුතු නොකිරීම මත, මේ වන තෙක් කොන්ත්‍රාත් ගිවිසුම සංශෝධනය කිරීමට නොහැකි වී ඇත. අදාළ වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.	පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. වැය කළ මුදලට ප්‍රතිලාභ ලබා ගැනීමට කඩිනමින් සැපයුම්කරු සමඟ සාකච්ඡා කර ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ගලා එන පරිදි මෙහෙයුම් කටයුතු සිදු කල යුතුය.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 34.5 ක් වන නුවරඑළිය ඉඩමක ඉදිකිරීමට යෝජිතව තිබූ	මේ වන විට **Ellipse Project SAS , France** කොන්ත්‍රාත්	ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ඉටු

උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ණය සැලසුම් ගාස්තු ලෙස යුරෝ 264,492.34 ක් එනම් රු.51,047,021 ක් ගෙවා තිබුණත්, 2021 වර්ෂයේදී ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් ඒ සඳහා වැය කළ මුළු වියදම නිෂ්කාර්ය වී තිබුණි. ඊට අමතරව 2023 වර්ෂයේදී මෙම කොන්ත්‍රාත්කරු විසින් යුරෝ 23,026,417.76 ක වන්දි මුදලක් ද ව්‍යාපෘතියේ උපදේශන ආයතනය වන මොරටුව විශ්ව විද්‍යාලය විසින් ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් රු.378,067,000 වන්දි මුදලක් ද ඉල්ලුම් කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් ඒ සඳහා නීතිපති උපදෙස් විමසා තිබුණු ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නීතිමය කටයුතු විසදි නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය අවලංගු කිරීම හේතුවෙන් කොන්ත්‍රාත් සහ උපදේශන ආයතන විසින් ඉදිරිපත් කල හිමිකම් පෑම අධ්‍යනය සඳහා විශේෂඥ උපදේශනයට සමාලෝචිත වර්ෂය තුල රු.3,648,000 ක් ද ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.	ආයතනය වන්දි ඉල්ලීම සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලියකට යොමු වී ඇත. ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත කටයුතු කරන අතර මේ වන විට බේරුම්කරණ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.	කිරීම සැලසුම් කළ යුතු අතර රජයට පාඩුවක් සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට වග බලා ගත යුතුය.

4.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවෙන් විගණනය සඳහා ලද තොරතුරු අනුව තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත "ජයගමු" තේමාව යටතේ එළිමහන් කායවර්ධන මධ්‍යස්ථාන 02 ක් ස්ථාපිත කිරීම සඳහා රු.2,000,000 ක මුදලක් ලබා දී තිබු අතර ඉන් රු.1,850,000 ක් නිශ්චිත කාර්යයන් සඳහා වැය කර ඇති බවට අමාත්‍යාංශය විසින් විගණනය වෙත වාර්තා කර තිබුණද ප්‍රාදේශිය සභාවේ ගිණුම් පරීක්ෂාවේදී මෙම මුදල එම කාර්යයන් සඳහා භාවිතා නොකර වසර 5 ක් තිස්සේ නිෂ්කාර්යව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතිය පිළිබඳ ඉදිරියේදී පරීක්ෂා කර එළිමහන් කායවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට අවශ්‍යතාවයක් නොමැති නම් එම ප්‍රතිපාදන නැවත පවරා ගැනීමට කටයුතු කරමි.	අමාත්‍යාංශය විසින් ලබා දෙන ප්‍රතිපාදන පිළිබඳව පසුවිපරම් කිරීමට කටයුතු කල යුතුය.

4.5 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	ක්‍රිකට් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම තුලින් ප්‍රාදේශිය මට්ටමින් ක්‍රිකට් ක්‍රිඩාව ඉහල නංවා කුසලතා සහිත ක්‍රිකට් ක්‍රිඩක ක්‍රිඩිකාවන් 3000 ක් හඳුනා ගැනීමේ අරමුණ ඇතිව රුපියල් මිලියන 1500 ක ප්‍රතිපාදනයන් වෙන් කරවාගෙන තිබුණු අතර මෙම ව්‍යාපෘතිය පාසල් 373 ක ක්‍රියාත්මක කිරීම සඳහා ඉන් රු. මිලියන 507.88 ක් පමණක් උපයෝජනය කර තිබීමෙන් රු.මිලියන 992.12 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී පැවතුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී රජයේ ණය බර අවම වන පරිදි වැය කරන ප්‍රතිපාදන පූර්ණ උපයෝජනය වන ලෙස අවශ්‍යතාවන් හඳුනාගැනීමට ප්‍රමුඛතාව ලබා දී ඇත.	ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකි ව්‍යාපෘති හඳුනාගෙන ඒ සඳහා පමණක් ප්‍රතිපාදන සම්පාදනය කල යුතුය.
(i)	විගණනයට භාජනය වු දිස්ත්‍රික්ක 7 ක පාසල් 99 ක් සඳහා රු.මිලියන151.**94**ක ප්‍රතිපාදන මුදාහැර තිබු අතර ඉන් පාසැල් 35 ක් 2024 අවසාන වන විටත් උපයෝජනය කර තිබුණේ රු.මිලියන45.42 හෝ සියයට 30 ක් පමණි.	වර්ෂ අවසානයේදී පැවති කාළගුණ තත්ව යටතේ සමහර දිස්ත්‍රක්වල නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.	ඉදිකිරීම් ව්‍යාපෘති නිසි අධීක්ෂණයෙන් යුක්තව කරගෙන යාමටත් නිසි කලට ව්‍යාපෘති වල ප්‍රගතිය පසු විපරම් කිරීමටත් අවධානය යොමු කල යුතුය
(ii)	අනුමැතිය ලබා දී තිබු තවත් දිස්ත්‍රික්ක තුනක පාසැල් 25 ක් සඳහා ලබා දී තිබු ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 28.70 ක වියදම් දරා තිබුණද එම පාසල් වල වැඩ නිම නොකර අතර මග නවතා තිබුණි.	වර්ෂ අවසානයේදී පැවති කාළගුණ තත්ව යටතේ සමහර දිස්ත්‍රක්වල නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.	ඉදිකිරීම් ව්‍යාපෘති නිසි අධීක්ෂණයෙන් යුක්තව කරගෙන යාමටත් නිසි කලට ව්‍යාපෘති වල ප්‍රගතිය පසු විපරම් කිරීමටත් අවධානය යොමු කල යුතුය
(iii)	මෙම ක්‍රිකට් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාසල් වල පවතින මූල්‍ය පහසුකම්**,** යටිතල පහසුකම්**,** උපකරණ සහ අවශ්‍යතාවය පිළිබඳ නිසි අධ්‍යනයක් සිදු නොකර මුදල් නිදහස් කර තිබීමෙන් පාසැල් 07 ක් විසින් රු.මිලියන 10.55 ක වැය දරා ඉදිකර තිබු පැති විකට් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.	මෙම පාසල් ක්‍රිකට් ක්‍රිඩාව ආරම්භ කිරීම සඳහා අළුතින් හඳුනාගන්නා ලද පාසල් වන අතර අවශ්‍යතා සම්පූර්ණ වූ පසුව මෙම පැති විකට් භාවිත කර ක්‍රිකට් ක්‍රිඩාව ආරම්භ කිරීමේ හැකියාව ඇත.	ඉදිකිරීම් ව්‍යාපෘති නිසි අධීක්ෂණයෙන් යුක්තව කරගෙන යාමටත් නිසි කලට ව්‍යාපෘති වල ප්‍රගතිය පසු විපරම් කිරීමටත් අවධානය යොමු කල යුතුය

(iv)	පුත්තලම් දිස්ත්‍රික්කයේ ක්‍රීඩාපිටිය සංවර්ධනය සහ පැති විකට් සැදීමේ වියදම 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5.68 ක් ලෙස දක්වා තිබුණද පාසල් 03 ක ක්‍රිඩා පිටි සංවර්ධන කටයුතු නිමකර නොතිබුණු අතර ඒ සඳහා එකතු වටිනාකම රු.මිලියන 3.32 ක චෙක්පත් 03 ක් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය නමින් ලියා ගණකාධිකාරි භාරයේ රඳවාගෙන තිබුණි. එහෙත් විගණිත දින වන විට මෙම චෙක්පත් වල වලංගු කාලය ඉකුත් වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුවූ සිවිල් ඉංජිනියරින් ආයතනය වෙත චෙක්පත් නොලියා මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය වෙත චෙක්පත් ලිවීම විගණනයට මතභේදයට තුඩු දෙන කරුණක් විය.	ඒ සම්බන්ධව ඉදිරියේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් විමසා තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.	ඉදිකීරීම් ව්‍යාපෘති නිසි අධීක්ෂණයෙන් යුක්තව කරගෙන යාමටත් නිසි කලට ව්‍යාපෘති වල ප්‍රගතිය පසු විපරම් කිරීමටත් අවධානය යොමු කල යුතුය
(v)	විගණනයට අනාවරණය වු කරුණු අනුව පැති විකට් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ පිළිපැදීම් කර තිබුණේද යන්න පිලිබඳව පසු විපරම් නොකිරීම හේතුවෙන් එක් ව්‍යාපෘතියක් සඳහා තොරා ගත් කොන්ත්‍රාත් කරු වෙත තවත් ව්‍යාපෘති ලබා දීම ද කොන්ත්‍රාත් කරුවන්ගෙන් ලංසුපත් කැඳවීමට ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම ද මිල කැඳවීම් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සිදු නොකිරීම ද ක්‍රීඩා පිටි හෝ පැති විකට් ඉදිකිරීම සම්බන්ධයෙන් පලපුරුද්දක් නොමැති කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවාගෙන තිබීමද කොන්ත්‍රාත් විචලනයන් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබීමද යන අවිධිමත් ක්‍රියාවන් නිරීක්ෂණය විය.	වර්ෂ අවසානයේදී පැවති කාළගුණ තත්ව යටතේ සමහර දිස්ත්‍රක්වල නියමිත පරිදි ක්රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.	ඉදිකීරීම් ව්‍යාපෘති නිසි අධීක්ෂණයෙන් යුක්තව කරගෙන යාමටත් නිසි කලට ව්‍යාපෘති වල ප්‍රගතිය පසු විපරම් කිරීමටත් අවධානය යොමු කල යුතුය

4.6 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඉහත මධ්‍යස්ථානයේ බාහිර ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ABT පිටියක් සැකසීම වෙනුවෙන් රු.4,859,000 ක් වියදම් දරා තිබුණද, 2024 දෙසැම්බර් 31 දින දක්වා ABT පිටිය සහ උපකරණ භාවිතයට නොගෙන නිශ්කාර්යයව පැවතුණු බව	ඒබීටී පිටිය සැකසීමේ කර්මාන්තයේදී වැඩියෙන් ගෙවා ඇති බව නිරීක්ෂණයවූ විශේෂ ශාස්තු උපලේඛන 05ක් සඳහා රු.141,789.00 ක මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර ඇති	අපේක්ෂිත අරමුණු ඉටු වන පරිදි ඉදිකිරීම් සිදු කල යුතු අතර සියලුම ගෙවීම් සඳහා බලයලත් නිලධාරියෙකුගේ අනුමැතිය ලබා ගත යුතුය.

නිරීක්ෂණය වූ අතර බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණු විශේෂ ගාස්තු සඳහා රු.141,789 ක් වැඩියෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.	බව දන්වා ඇත.	

4.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කළ වාහන 17 ක් අමාත්‍යාංශය සතුව භෞතිකව නොපවතින අතර එම වාහන මේ වන විට කුමන ආයතන සතුව පවතින්නේද යන්න පිළිබඳව සොයා බලා නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හෝ එම ආයතන වලට පවරා දීමට හෝ කටයුතු කර නොතිබුණි.	රථ 06ක් මේ වන විට පරිහරණය කරන ආයතනය සම්බන්ධව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇත. ඉතිරි වාහන 11 සම්බන්ධයෙන් කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයෙන් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.	අමාත්‍යාංශය සතු වාහන පිළිබඳව කඩිනමින් සොයා බැලිය යුතු අතර වෙනත් ආයතන වෙත ඇති වාහන එම ආයතනයට පවරා දීමට හෝ අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට හෝ කටයුතු කල යුතුය.
(ආ)	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලබා දී දැනට අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වාහන 03 ක්ද වාරිමාර්ග අමාත්‍යාංශය සතු වාහන 02ක්ද උද්භිත හා සත්වෝද්‍යාන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු අංක PA 9349 දරන වාහනයද මෙතෙක් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම රථ පවරා ගැනීම/පවරා දීම සඳහා අවශ්‍ය කටයුතු මෙ වන විට සිදු කරමින් පවති.	අදාල ආයතන වලට පවරා දීමට හෝ පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.
(ඇ)	ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන මධ්‍යස්ථාන භූමිය තුල පෞද්ගලික දේපල හා පෞද්ගලික පදිංචිකරුවන් සිටින බැවින් නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට මෙම භූමිය නිරවුල්ව භාවිතා කිරිමට නොහැකි වී තිබුණි.	1992 වර්ෂයේ සිට නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉල්ලීම් කර ඇතත් මේවනතෙක් එකඟතාවය නොලැබීම මත නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය වෙත නිරවුල්ව ඉඩම පැවරීමේ කටයුතු ප්‍රමාද වී ඇත.	අමාත්‍යාංශය සතු දේපළ නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුය.

(ඈ)	ජනාධිපති ලේකම් කාර්යාලය, වෙනත් අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන වෙත තාවකාලිකව මුදා හරින ලද අංක CAF 2536, KE 6296, JO 9554 දරන වාහන 03 ක් නැවත ලබා ගැනීමට හෝ එම ආයතන වලට නීත්‍යානුකූලව අයිතිය පවරා දීමට හෝ කටයුතු කර නොතිබුණි.	මෙම රථ පවරා ගැනීම/පවරා දීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.	අදාල ආයතන වලට පවරා දීමට කටයුතු කල යුතුය.
(ඉ)	අංක PB 9860 දරන රථය අයිතිය පවරා ගැනීමෙන් පසු අලුත්වැඩියා කිරීම සුදුසු බව ඉංජිනේරු වාර්තාවෙන් නිර්දේශ කර තිබුණද එම වාහනයේ අයිතිය පවරා ගැනීම හා අලුත්වැඩියා කිරීමකින් තොරව වර්ෂ 2 කට වැඩි කාලයක් අමාත්‍යාංශ පරිශ්‍රයේ නිශ්කාර්යව ගාල් කර පවතින බව නිරීක්ෂණය විය.	පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.	අදාල ආයතනයෙන් පවරා ගැනීමට පියවර ගත යුතුය.
(ඊ)	අංක KH 0989 දරන රථයේ එන්ජින් අංකය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ පවතින එන්ජින් අංකයට වඩා වෙනස් බැවින් ලියාපදිංචි සහතිකය සංශෝධනය කර වාහනයේ නඩත්තු කටයුතු කළ යුතු බව නිර්දේශ කර තිබුණද, මෙතෙක් කිසිදු නිර්දේශයක් ක්‍රියාත්මක නොකර අමාත්‍යාංශ පරිශ්‍රයේ නිශ්කාර්යව ගාල්කර පැවතුණි.	මෙම වාහනය අපහරණ ක්‍රියාවලිය යටතේ සුන්බුන් ලෙස අපහරණය කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.	05/2024 වත්කම් කලමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය.

4.8 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ 2016 නොවැම්බර් 29 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව රු.6,894,735 මුදලකට නවීන තාක්ෂණය භාවිතා කරමින් දක්ෂතා හඳුනාගැනීමේ ක්‍රියාවලියට උපකාර කිරීම, සියලුම ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම, ශාරීරික යෝග්‍යතා ආබාධ සඳහා ප්‍රතිකාර සඳහා යොමු කිරීම සහ අවශ්‍ය විටෙක අදාළ අනෙකුත් සියලුම වෛද්‍ය තොරතුරු සම්බන්ධයෙන් බලයත් නිලධාරීන් සඳහා ක්‍රීඩකයන්ගේ වෛද්‍ය වාර්තා ලබා දීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා මෘදුකාංගයක්	පරිගණක දත්ත මෘදුකාංග පද්ධතිය සඳහා නඩත්තු ගිවිසුමකට එළඹීම සඳහා කමිටුවක් 2025.02.03 දින පත් කරන ලද අතර එහි දී යෝජනා වූයේ මෙය භාවිතා කරන නිලධාරීන්ගෙන් එය භාවිතයේ දී ඇති වන දුෂ්කාරතා හා ගැටළු හඳුනාගෙන ලිඛිතව ආයතනයට භාර දීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවයි. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	ව්‍යාපෘති ක්‍රමවත්ව කලමනාකරණය සහ නියාමනය සිදු කල යුතු වීම.

	සකස් කර තිබුණද එයින් අපේක්ෂිත අරමුණු ආයතනය විසින් ඉටු කරගෙන නොතිබුණි. තවද, පද්ධතිය නිම කිරීමෙන් මාස 06 කින් පසුව නිදහස් කල යුතුව පැවති රඳවා ගැනීමේ ගාස්තු වූ රු. 1,378,947 ක මුදල දින කිහිපයකින් මුදා හැර තිබුණු අතර මෙම මෘදුකාංගය නඩත්තු කිරීම පිළිබඳ ගිවිසුමට එළඹීමට ද අපොහොසත් වී තිබුණි.		
(ආ)	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2023.05.16 වන දින ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සිව් දෙනෙකු ගෙන් යුත් කමිටුවක් පත් කර තිබුණි. එහෙත් විගණිත දින දක්වා ප්‍රායොගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටළු සහිත අවස්තා නිරාකරණය වන ලෙස සංශෝධනය කිරීමට හා යාවත්කාලීන කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.	ජනාධිපති ලේකම් විසින් පත් කරන ලද කමිටුවට අමතරව ක්‍රීඩාව හා නීතිය සම්බන්ධ විද්වත් පිරිසකගෙන් යුත් කමිටුවකින් ක්‍රීඩා පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත් සකසන ලද අතර එම කෙටුම්පත් ගරු අමාත්‍යතුමා වෙත හා ජනාධිපති ලේකම් වෙත ඉදිරි උපදෙස් සඳහා ඉදිරිපත් කර ඇත.	ක්‍රීඩා පනත කඩිනමින් සංශෝධනය සහ යාවත්කාලීන කිරීමට කටයුතු කල යුතුය.

5 . මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11 ක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 2 ක් ද, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 35 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 1 ක් ද, පැවතුණි. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ සහ තෘතික මට්ටමේ පුරප්පාඩු 02 බැගින් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 09 ක් පැවතුණි. ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ හා ක්‍රීඩා විද්‍යා ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6 බැගින් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු පිළිවෙළින් 01 හා 08 බැගින් ද, ද්විතීක මට්ටමේ පුරප්පාඩු පිළිවෙළින් 04 හා 10 බැගින් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු පිළිවෙළින් 05 හා 03 බැගින් ද හඳුනා ගැනීමට හැකිවිය.	මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.	අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත කාර්ය මණ්ඩලය නැවත සංශෝධනය කිරීමට හෝ බඳවා ගැනීමට හෝ කටයුතු කල යුතුය.

(ආ)	නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය 1985 වර්ෂයේ ආරම්භ කර ඇති අතර මධ්‍යස්ථානය සඳහා අනුමත වී ඇති කාර්යය මණ්ඩලය සඳහා නව තනතුරු ඇතුලත් කර සංශෝධනය කර නොමැති බව නිරීක්ෂණය විය. වර්තමානයේ මෙම මධ්‍යස්ථානය තුල භෞතික ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් බහුලව ඇති අතර කාර්මික නිලධාරියෙකු නොමැති බවත්, ශාරීරික යෝග්‍යතා පුහුණුවීම් ලබා දීම සඳහා සහ අලුතින් සකස් කර ඇති Out Bounding ක්‍රියාකාරකමෙහි කටයුතු කිරිම සඳහා පුහුණු නිලධාරීන් කාර්යය මණ්ඩලය තුල නොමැති බවත් නිරීක්ෂණය විය.	සුදුසුකම් සැපිරූ පුහුණුකරුවන් අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත්කර ඉදිරියේදී බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.	අවශ්‍යතාවය පරිදි නව තනතුරු ඇති කර බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කල යුතුය.